Ministry of
Labour and
Foreign Employment

NIOSH
National Institute of
Occupational Safety and
Health • Sri Lanka

# වාර්ෂික වාර්තාව
# ஆண்டறிக்கை
# Annual Report

# 2022




**ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය ආයතනය**

தசிய தொழில்சார் பாதுகாப்பு மற்றும் சுகாதார நிறுவகம்

**National Institute of Occupational Safety & Health**

# වාර්ෂික වාර්තාව
# 2022

**ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා**
**සෞඛ්‍යය ආයතනය**

# වාර්ෂික වාර්තාව - 2022

**සම්පාදනය**
චම්පිකා අමරසිංහ , මොහාන් පෙරේරා , සදුලි සුමනදේව

**ප්‍රකාශනය**
ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය ආයතනයේ
ප්‍රකාශන කමිටුව

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය ආයතනය
නො. 97/ජාවත්ත පාර,කොළඹ 05. ශ්‍රී ලංකාව
ටෙලි : +94 112 2 585 425

**සියලු හිමිකම් ඇවරිණ**
2022

**ISBN - 978-624-6017-03-3**



2009 අංක 38 දරන ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය පිළිබඳ ආයතන පනත මඟින් කම්කරු හා කම්කරු සබදතා අමාත්‍යාංශයේ අනුබද්ධ ආයතනයක් ලෙස ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය ආයතනය පිහිටුවන ලදී ස්වයං මූල්‍යය ආයතනයක් ලෙස ක්‍රියාත්මක වන අප ආයතනයේ මුඛ්‍යය පරමාර්ථය වනුයේ ජාත්‍යන්තර මට්ටමේහි වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය සේවාවන් ලබාදීමයි.

ආරම්භයේ පටන්ම සම්මන්ත්‍රතරණ පැවැත්වීම හා වෘත්තීය සුරක්ෂිතතා නිළධාරීන් පුහුණු කිරීම හා සාමාන්‍යය ජනතාව වෘත්තීය සුරක්ෂිතතාව පිළිබඳ දැනුවත් කිරීම ආදි කටයුතු වල නිරතවී සිටින්නෙමු. වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය පිළිබඳ වෘත්තීකයන්ට නව දැනුම ලබාදීමට හා ඔවුන්ගේ දැනුම ඔවුන් අතර හුවමාරු කර ගැනීමට අවශ්‍යය පසුබිම අප විසින් නිර්මාණය කරදෙන්නෙමු. වැඩ පරිසරයක් පවත්වාගෙන යාම පිළිබඳ ජනතාව දැනුවත් කිරීම ආරක්ෂාකාරි වැඩ පරිසරයක් නිර්මාණය කිරීම හා නිවැරදි ලෙස පවත්වාගෙන යාමට අවශ්‍යය දැනුම නිරන්තරයෙන් ලබාදීමට අප කටයුතු කරන්නෙමු.

අප සෑම විටම අපගේ පාරිභෝගිකයන්ට ගරු කරමින් අපක්ෂපාතීව තාක්ෂණික සේවාවන් ලබාදීමට කටයුතු කරන්නේමු. වෘත්තීය අනතුරු වළක්වා ගැනීමට අවශ්‍යය දැනුම ඔවුන් වෙත ලබාදීමට මෙන්ම අවශ්‍යය අවස්ථාවලදි ඔවුන්ට අවශ්‍යය පුහුණුව ලබාදීමට ද අප නිරන්තයෙන් කැපවී සිටින්නෙමු .අප ලබා දෙන පුහුණුව තුළින් සේවා ස්ථානයේ ඇති අනතුරු හදුනාගෙන ඒ සදහා අවශ්‍යය විසදුම් ලබා ගැනීමටත් ඔවුන්ට හැකියාව ඇත.

වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය පිළිබඳ ජාතික හා ජාත්‍යන්තර වශයෙන් කටයුතු කරන එකම රාජ්‍යය ආයතනය අප ආයතනය වන බැවින් ශ්‍රී ලාංකික ජනතාවට අවශ්‍යය සේවාව සැපයීම උදෙසා අප නිරන්තරයෙන් කටයුතු කරන්නෙමු.

වෛද්‍යය එන් සි අමරසිංහ
අධ්‍යක්ෂ ජනරාල්

# පටුන


ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්තුමියගෙ පණිවුඩය V

පළමු පරිච්ඡේදය (ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය ආයතනය)

1.1 හැඳින්වීම 2

1.2 දැක්ම, මෙහෙවර හා අරමුණ 3 - 4

1.3 සුවිශේෂී ප්‍රමුඛතා 5

1.4 ආයතනයෙහි කාර්යමණ්ඩලයේ සංයුතිය 5

දෙවන පර්ච්ඡේදය (ආයතනයේ ප්‍රධාන කාර්යයන්)

2.1 සේවා සැපයීම 8 - 13

2.1.1 දෛනික කටයුතු 8

(අ) පාරිසරික මිනුම් 8

(ආ) අවදානම් ඇගයීම 8

(ඇ) වෛද්‍යයම පරීක්ෂණ 9

2.1.2 විශේෂ වැඩසටහන් 9

(අ) විශේෂ පුහුණුවීම් 9

පළමු මට්ටම 10

දෙවන මට්ටම 11

තෙවන මට්ටම 12

(ආ) ව්‍යාපෘති 12

(ඇ) ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය සම්මාන උළෙල පැවැත්වීම 12

(ඈ) ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය සම්මන්ත්‍රණය පැවැත්වීම 12

(ඉ) වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය ක්ෂේත්‍රයන්ට
අදාළ පර්යේෂයන්හි නිරත විම 13
(ඊ) ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය
නිලධාරි ජාතික සංගමය පිහිටුවිම 13
(එ) සුභසාධන කාර්යන්හි නිරතවිම 13
2.1.3 ජාත්‍යන්තර සහයෝගිතාව 13
2.2 සේවා පහසුකම් දියුණු කිරිම 14
2.2.1 ආයතනයේ ප්‍රමිතිය ඉහළ නංවා ගැනිමට
අවශ්‍යය තත්ත්ව සහතික ලබා ගැනිම 14
තෙවන පරිච්ජේදය (ආයතනයේ ප්‍රගතිය)
සිව්වන පරිච්ජේදය (ආයතනයේ සුවිශේෂ ජයග්‍රහණ)
පස්වන පරිච්ජේදය (ආයතනයේ මුල්‍යය විශ්ලේෂණය)

වගු නාමාවලිය

1.4 වගුව ආයතනයේ කාර්ය මණ්ඩලයේ සංයුතිය 5
3.1 වගුව පාරිසරික මිනුම් සමීක්ෂණ 16
3.1.2 වගුව විශේෂ වැඩසටහන්වල ප්‍රගතිය 17
3.2 වගුව විශේෂ වැඩසටහන්වල ප්‍රගතිය 17 - 18

# පළමු
# පරිච්ඡේදය

## ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය ආයතනය

# ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය ආයතනය

## 1.1 හැඳින්වීම

ශ්‍රී ලංකාව තුළ යහපත් වෘත්තීය ආරක්ෂණ ක්‍රියාමාර්ග හා යහපත් සෞඛ්‍යය පුරුදු අනුගමනය කරමින් සුරක්ෂිත හා සෞඛ්‍යය සම්පන්න ශ්‍රමබලකායක් බිහි කරලීමේ අරමුණින් 2009 අංක 38 දරණ ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍යය පිළිබඳ ආයතන පනත මඟින් කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ අනුබද්ධ ආයතනයක් ලෙසින් ජාතික වෘත්තිය සුරක්ෂිතතා හා සෞඛ්‍යය ආයතනය ස්ථාපිත කරන ලදී.

රටක් සංවර්ධනය කරා යන ගමනේදී එය ප්‍රධාන දායකත්වය සලසන්නේ එරට වෙසෙන ශ්‍රම බලකාය බව අමුතුවෙන් කිවයුතු කරුණක් නොවේ. ඔවුන් තුළින් තිරසාර සංවර්ධනයක් අත්පත් කර ගැනීමට අවැසි වන්නේ නම් ඔවුන්ගේ සුරක්ෂිතතා-වය හා සෞඛ්‍යය සම්පන්නතාවය ඉහළ මට්ටමක පැවතීම අතවශ්‍ය කරුණක් වන්නේය. ශ්‍රී ලංකාව තුල එහි භාරදූරය කර්තවය ඉටුකරනවස් ඇපකැපවී කටයුතු කරන එකම රාජ්‍යය ආයතනය ලෙසින් අප ආයතනය ජාතික මෙහෙවරේ නිරතවන්නෙමු. එහිදී අප නිරන්තරයෙන් සිදු කරන දෛනික කටයුතු විශේෂ පුහුණුවීම් වැඩසටහන් මඟින් ශ්‍රී ලාංකිය ශ්‍රම බලකායේ සුරක්ෂිතතාව හා සෞඛ්‍යය සම්පන්නභාවය ඉහළ නැංවීමට අප කටයුතු කරනු ලැබේ.

දෛනිකව සිදු කරනු ලබන පාරිසරික මිණුම් සමීක්ෂණ , අවදානම් ඇගයීම හා වෛද්‍යය පරීක්ෂණ මගින් මෙන්ම විශේෂ වැඩසටහන් ලෙස ක්‍රියාත්මක කරනු ලබන පුහුණුවීම්, ව්‍යාපෘති මඟින් හා වෙනත් රටවල් සමඟ අන්තර්ජාතික සහයෝගීතාවය මත සිදු කරනු ලබන ක්‍රියාකාරකම් තුළින් ශ්‍රී ලංකාව තුළ වැඩදායී ශ්‍රම බලකායක් බිහි කරවාලීමට අප වගබලා ගන්නෙමු.

සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙස පවතින අප රටෙහි දළ දේශිය නිෂ්පාදනය ඉහළ නංවාලීමට සෘජුවම බලපෑම් එල්ල කරනු ලබන වැඩ කරන ජනතාවගේ සේවයේ සුරක්ෂිතතාවය හා සෞඛ්‍යය සම්පන්න බව ආරක්ෂා කරදෙමින් සංවර්ධනය කරා වේගයෙන් පියනැගීමට අවශ්‍යය වන ශ්‍රම බලකායන් අප රටට දායාද කිරීම අපගේ ඒකායන පරමාර්ථයයි.එසේ යන ගමනේදී අප ආයතනයේ සහය නොමඳව ලබා දීමට අප නිරන්තයෙන් කැපවී සිටින්නෙමු.

# 1.2 දැක්ම මෙහෙවර හා අරමුණු

## දැක්ම

"සැමට වෘත්තීය සුරක්ෂිතතාව සෞඛ්‍යය හා සුබ සාධනය ලබාදීම "

## මෙහෙවර

"සේවා ස්ථානවල සුරක්ෂිතතාවය හා සෞඛ්‍යය සහතික කරලීම සහ ඵලදායීතාව වර්ධනය කිරීම සදහා සියලු ආකාරයේ රැකියා උපද්‍රවයන් වළක්වාලීම පිණිස අධ්‍යාපනය පුහුණුව හා පර්යේෂණය තුළින් ත්‍රෛපාර්ශවීය කොටස්කරුවන් සවිබලගැන්වීම "

## ආයතනයේ අරමුණු

(අ) සේවායෝජකයත්ගේ සහ සේවාදායකයන්ගේ ආරක්ෂාව සහ රැකියාවේ ආරක්ෂාව සහ රැකියාවේ ස්වභාවය සැලකිල්ලට ගනිමින් ඒ සේවායෝජකයන් සහ සේවාදායකයන් යන දෙපාර්ශවයේම සේවා පරිසරය සම්බන්ධයෙන් වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ජාතික ප්‍රතිපත්තික් සකස් කිරීමේදි රජයට උපදෙස් දීම.

(ආ) සේවා ස්ථානවල දී රැකියාවට අදාළව සිදුවන හදිසි අනතුරු වැළැක්වීම සඳහා ගතයුතු පියවර සම්බන්ධයෙන් රජයට උපදෙස් දීම.

(ඇ) වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ විමර්ශන අධයාපන වැඩසටහන් සමීක්ෂණ සහ පර්යේෂණ පැවැත්වීම කරගෙන යාම සහ ඒවාට සහාය දීම.

(ඈ) උපකරණ , අන්තරායදායක ද්‍රව්‍ය , භෞතික , රසායනික හෝ ජීව විද්‍යාත්මක කාරක හෝ නිෂ්පාදන හෝ වෙනත් යම් අන්තරායකාරී ද්‍රව්‍ය නිවැරදිව භාවිතා කිරීම පිළිබඳ යම් ආයතනයකට හෝ තැනැත්තකුට උපදේශන සේවා සැපයීම.

(ඉ) වෙනත් යම් ආයතනයක් හෝ ලංකාවේ හෝ පිටරටක විශ්ව විද්‍යාලයක් සමඟ සහයෝගීතාවයෙන් හෝ ආයතනය විසින් වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ සහ ආශ්‍රිත විෂයයන් පිළිබඳ දැනුම සහ පුහුණුව අවශ්‍යය කරන සේවා නියුක්තිකයන්ට , පදිංචිකරුවන්ට , සේවකයන්ට හෝ වෙනත් යම් තැනැත්තකුට අධ්‍යාපන සහ අවශ්‍ය පුහුණුව ලබාදීම සහ ඒ අධ්‍යානපනය හෝ පුහුණුව නිම කිරීමෙන් පසු සහතික පත්‍ර හෝ ඩිප්ලෝමා ප්‍රදානය කිරීම.

(ඊ) උපකරණ , අන්ත්‍රාදායක ද්‍රව්‍ය , භෞතික , රසායනික , ජීව විද්‍යාත්මක කාරක හෝ නිෂ්පාදන නිවැරදිව භාවිත කිරීම පිළිබඳ සහ මනෝ සමාජ අන්ත්‍රායන් සහ හඳුනාගත් අන්ත්‍රායන් වැළැක්වීම පිළිබඳ අවශ්‍ය කරන සේවාවන් සැපයීම.

(උ)(ස) වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍යට අදාළ වන කාරණාවලදී ප්‍රමිතිසංකේත, පරිචය සහ නියමු උපදේශන සම්බන්ධයෙන් නීතිමය අවශ්‍යතා පිළිබඳ අමාත්‍යවරයාට උපදෙස් දීම.

(සස) වැඩ කටයුතු නිවැරදිව ක්‍රියාත්මක වන්නේ ද යන්න අධීක්ෂණය හා නිසියාකාරව සිදු වන්නේ ද යන්න ඇගයීමට ලක්කිරීම.

(ඌ) වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍යට අදාළ තොරුතුරු එක්රැස් කිරීම, සකස්කිරීම, බෙදාහැරීම සහ ප්‍රකාශයට පත්කිරීම සඳහා සහයෝගයෙන් කටයුතු කිරීම.

(එ) වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍යට සම්බන්ධව සම්මන්ත්‍රණ, වැඩමුළු හා වෙනත් වැඩසටහන් සම්පාදනය කිරීම සහ අනුග්‍රහය දැක්වීම.

(ඒ)වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය පිළිබඳ අන්තර් අමාත්‍යාංශ ව්‍යාපෘති, වැඩසටහන් සහ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම.

(ඔ)වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය පිළිබඳ පුහුණු ප්‍රවර්ධනය කිරීම සහ වැඩ දියුණු කිරීම සඳහා පුස්තකාල සහ විද්‍යාගාර පිහිටුවා පවත්වාගෙන යාම.

(ඕ) පර්යේෂණ සහ විශේෂ රසායනාගාර සංවර්ධනය කිරීම.

(සෘ) වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය ක්ෂේත්‍රය ට අදාළ ජාතික හා ජාත්‍යන්තර ආයතන විශ්වවිදයාල හා අනෙකුත් සංවිධාන සමඟ සබදතා පවත්වාගෙන යාම.

(ඍෘ) වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය යන ක්ෂේත්‍රවල ජාතික ප්‍රමිතීන් ස්ථාපනය කිරීම.

## 1.3 සුවිශේෂී ප්‍රමුඛතා

1 වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පනත අනුව කටයුතු කරමින් කාලීන අවශ්‍යයතාවයන්ට අනුව සේවා සුරක්ෂිතතාවය හා සෞඛ්‍යය ගොඩනංවාලීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

2 වැඩකරන ජනතාවට ආරක්ෂිත පරිසරයක් තුළ සෞඛ්‍යය සම්පන්නව සේවයේ නිරතවීමට අවශ්‍යය වැඩ පරිසරයෙන් සේවා ස්ථානය තුළ නිර්මාණය කරදීමට කටයුතු කිරීම.

3 වෘත්තීය සුරක්ෂිතතා නිලධාරීන්ගේ දැනුම වර්ධනය කරමින්, නව තාක්ෂණික උපකරණ පිළිබඳව අවබෝධය ලබා දෙමින් ප්‍රමිතියෙන් ඉහළ සෞඛ්‍යය හා ආරක්ෂණ ක්‍රම සේවා ස්ථානවල පවත්වාගෙනයාමට අවශ්‍යය පසුබිමක් සකස් කිරීම.

4 කාලීනව සේවා ස්ථානවල පැනනගින සෞඛ්‍යය හා ආරක්ෂණ ගැටලුවලට පිලියම් සෙවීමට නිරන්තරයෙන් කටයුතු කිරීම.

## 1.4 ආයතනයේ කාර්ය මණ්ඩලයේ සංයුතිය

| ජ්‍යෙෂ්ඨ මට්ටම | | තෘතීය මට්ටම | | ද්විතීය මට්ටම | | ප්‍රාථමික මට්ටම | | එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | පුරප්පාඩු |
| 07 | 02 | 03 | 03 | 10 | 06 | 05 | 05 | 25 | 16 | 36% |

**1.4 ආයතනයේ කාර්ය මණ්ඩලයේ සංයුතිය**

# දෙවන
# පරිච්ඡේදය

## ආයතනයේ ප්‍රධාන කාර්යයන්

# ආයතනයේ ප්‍රධාන කාර්යයන්

ආයතනයේ ප්‍රධාන කාර්යයන් පිළිබඳව විමසා බැලු කළ එය ප්‍රධාන කොටස් 2 ක් සමන්විතය. එනම්, සේවා සැපයිම හා ආයතනයේ සේවා පහසුකම් දියුණු කිරීමයි.

## 2.1 සේවා සැපයීම

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය ආයතනයේ ප්‍රධානතම කාර්යයන් වන්නේ සේවාලාභීන්ට අවශ්‍ය වන සේවාවන් ලබාදීම. එහිදී අප විසින් දෛනික කටයුතු මඟින් විශේෂ වැඩසටහන් මඟින් හා ජාත්‍යාන්තර සහයෝගිතාව මත පදනම් වෙමින් සේවා සැපයීම සිදුකිරීමට කටයුතු කරනු ලැබේ.

### 2.1.1 දෛනික කටයුතු

- පාරිසරික මිනුම් සමීක්ෂණ
- අවදානම් ඇගයීම
- වෛද්‍ය පරීක්ෂණ

#### (අ) පාරිසරික මිනුම් සමීක්ෂණ

සේවා ස්ථානවල වැඩපරිසරය රැකියාවේ නිරතවීමට අවශ්‍යය මට්ටමක පවතින්නේද යන්න පාරිසරික මිනුම් සමීක්ෂණ මඟින් විමසුමට ලක්කරනු ලැබේ.

වාතයේ තත්ත්වය සමීක්ෂණය කිරීම, දුම් පරීක්ෂා කිරීම, කර්මාන්තය තුළ දුවිලි මට්ටම සමීක්ෂණය කිරීම, ශබ්ද මට්ටම මැනීම සහ උෂ්ණත්ව මට්ටම සමීක්ෂණය කිරීම මෙහිදී සිදුකරනු ලැබේ. වැඩ පරිසරය යෝග්‍යය මට්ටමක පවතින්නේද යන්න උපකරණ යොදා ගනිමින් පරීක්ෂාවට ලක්කිරීම මෙහිදි සිදුවේ. සෞඛ්‍යයාරක්ෂිතව සේවයේ නිරතවීමට අවශ්‍යය පරිසරය ගොඩනැංවීමට ඔවුන්ට අවශ්‍යය උපදෙස් ලබාදීම සිදුකරන අතර ඒ පිළිබඳව නිරන්තර දැනුවත් කිරීම් අප විසින් අදාළ ආයතනය වෙත ගොස් මෙන්ම අප ආයතනය තුළදී ද මෙම පරීක්ෂාවන් සිදු කරනු ලැබේ.

#### (ආ) අවදානම් ඇගයීම

සේවයේ නිරත සේවකයන්ට මුහුණදීමට සිදුවන අවදානම් සහගත තත්වයන් පිළිබඳව විමසීමට ලක් කිරීමට අවදානම් ඇගයීම සිදු කරනු ලැබෙයි. එහිදී ද සුරක්ෂිතතා නිළධාරීන් අදාළ ආයතනය වෙත ගොස් එහි පවතින අවදානම් සහගත තත්ත්වයන් පරීක්ෂාවට ලක්කරනු ලැබෙයි. ආයතනය පරීක්ෂාවට ලක්කර එහි පවතින අවදානම් සහගත තත්ත්වයන් පිළිබඳව ඔවුන් දැනුවත් කරන අතර ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව ඔවුන්ට උපදෙස් ලබාදීම සිදුකරනු ලබයි.

### (ඈ) වෛද්‍යය පරීක්ෂණ

සේවකයන්ගේ සෞඛ්‍යය මට්ටම සේවය කිරීමට තරම් යෝග්‍යය මට්ටම පවතින්නේද යන්න නිශ්චය කිරීම උදෙසා වෛද්‍යය පරීක්ෂණ සිදු කරනු ලැබේ එහිදී පුද්ගලයන්ගේ ශ්‍රවණ තත්ත්වය මැනිමේ පරීක්ෂණ රුධිර විශ්ලේෂණය, පෙනහළුවල ක්‍රියාකාරීත්වය පරීක්ෂා කිරීම, දෘෂ්ටිය පරීක්ෂණ හා වැඩ කිරීමේ යෝග්‍යය තාව තක්සේරු කිරීමේ පරීක්ෂණ අප විසින් සිදු කරන ලබයි මේ සඳහා වෛද්‍යවරු හා අපගේ තාක්ෂණික නිලධාරීන් සහභාගි වන අතර ශ්‍රමිකයන් සේවයේ නිරතවීමට යෝග්‍යයබවන්නේද යන්න හා ඔවුන් තුළ පවතින රෝගාබාධ මොනවාද යන්න අදාළ ආයතනය දැනුවත් කරනු ලැබේ. එමෙන්ම ඔවුන් තුළ පවතින රෝගාබාධ සඳහා අනුගමනය කළ යුතු පිළිවෙන් මොනවාද යන්න ඔවුන් දැනුවත් කිරීමද මෙහිදි සිදු කරනු ලැබේ අප විසින් අදාළ ආයතනය වෙත ගොස් මෙන්ම අප ආයතනය තුළදී ද මෙම පරීක්ෂාවන් සිදු කරනු ලැබේ.

## 2.1.2 විශේෂ වැඩසටහන්


දෛනික සේවාවන් සැපයීමට අමතරව විශේෂ වැඩසටහන් පවත්වාගෙන යාම අප ආයතනයේ සපයන ප්‍රධාන සේවාවකි. එහිදී පුහුණු වැඩසටහන් , ව්‍යාපෘති, සම්මාන උළෙල පැවැත්වීම, සම්මන්ත්‍රණ පැවැත්වීම හා ක්ෂේත්‍රවට අදාළ පර්යේෂණයන්හි නියළීම අප විසින් සිදු කරනු ලැබේ. නිරන්තරයෙන්ම සිදුකරනු ලබන සේවාවන්ට අමතරව රටට සේවාවන් සැපයීමේ මුඛ්‍ය පරමාර්ථය පෙරදැරි කරගනිමින් කර්මාන්තයන්හි පවතින අවශ්‍යයතාවන් හදුනාගෙන මෙම විශේෂ වැඩසටහන් සිදුකරන අතර සමහර අවස්ථාවන්හිදී ආයතනවල ඉල්ලීම මතද මෙම විශේෂ වැඩසහටන් අප විසින් ක්‍රියාවට නංවනු ලැබේ.

### (අ) විශේෂ පුහුණුවීම්

අප විසින් සිදුකරනු ලබන විශේෂ පුහුණුවීම් වැඩසටහන් ප්‍රධාන මට්ටම් තුනක් යටතේ සිදු කරනු ලැබේ. එහිදී

- පළමු මට්ටම
- දෙවන මට්ටම
- තෙවන මට්ටම

වශයෙන් ප්‍රධාන මට්ටම් ලෙස අප ආයතනයේ පුහුණු පාඨමාලා හා වැඩමුළු බෙදා වෙන්කර ඇත. එහිදී අවශ්‍යය වෘත්තීය සුරක්ෂිතතාව පිළිබඳව අධ්‍යනය කිරීමට අපේක්ෂා කරන පුද්ගලයන් ලබා ඇති අධ්‍යාපන මට්ටම් අනුව සහ සේවා පළපුරුද්ද මත මෙම පාඨමාලාවන් හා පුහුණුවීම් සඳහා සහභාගිවීමට අවස්ථාව හිමි කරදෙනු ලැබේ. ජාතික වෘත්තීය සුරක්ෂිතතා උසස් ඩිප්ලෝමා පාඨමාලාව, ජාතික වෘත්තීය සුරක්ෂිතතා ඩිප්ලෝමා පාඨමාලාව (NVQ05), ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහතික පත්‍ර පාඨමාලාව හා කෙටිකාලින පුහුණුවීම් වැඩසටහන් අප විසින් පවත්වනු ලැබේ. එහි පාඨමාලා සැලැස්ම පහත ආකාරයට දැක්විය හැකිය.




පාඨමාලා සැලැස්ම

## ▪ පළමු මට්ටම

අප විසින් සිදුකරනු ලබන කෙටිකාලීන පුහුණු වැඩමුළු පළමු මට්ටමට ඇතුළත්වන විශේෂ පුහුණුවීම් ලෙස දැක්විය හැකිය.

- ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා වන වැඩමුළු
- අපද්‍රව්‍යය කළමනාකරණ පුහුණුවීම් වැඩමුළු
- වෘත්තීය සුරක්ෂිතතාවය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළු
- හෙදියන් සඳහා වන වැඩමුළු
- සෞඛ්‍යය සේවකයින් සඳහා වෘත්තීය ආරක්ෂාව පිළිබඳ වැඩමුළු
- කාර්යාල සේවකයින් සඳහා වෘත්තීය ආරක්ෂාව පිළිබඳ වැඩමුළු
- රසායනාගාර සේවකයින් සඳහා රසායනාගාර ආරක්ෂාව පිළිබඳ වැඩමුළු
- ආහාර කළමනාකරණය සඳහා වෘත්තීය ආරක්ෂාව පිළිබඳ වැඩමුළුව
- කාර්මික සේවකයින් සඳහා ආරක්ෂිත රසායනික කටයුතු පිළිබඳ වැඩමුළුව
- සේවකයින් සඳහා යහපත් මානසික සෞඛ්‍යයක් පවත්වාගෙ යාම පිළිබඳ වැඩමුළු

මෙම පුහුණුවීම් දිනක්, දෙකක් හෝ තුනක් සාමාන්‍යය වශයෙන් පවත්වනු ලැබේ. සමහර අවස්ථාවලදී කාර්මාන්තයන්හි ඉල්ලීම පරිදි මෙම පුහුණු වැඩසටහන් ක්‍රියාවට නංවනු ලැබේ. මෙම පුහුණුවීමේ වැඩසටහන් පළමු මට්ටමේ පුහුණුවීම් වන අතර අදාළ පුහුණුවීම් අවසානයේදී ඔවුන් ලැබූ පුහුණුව පිළිබඳව සහතික පත්‍රයක්ද ඔවුන් වෙත ලබාදීමට අප කටයුතු කරනු ලැබේ.

## ■ දෙවන මට්ටම

දෙවන මට්ටමට අයත් පුහුණුවීම් වැඩසටහන් ලෙස ප්‍රධාන වශයෙන් අප පවත්වනු ලබන්නේ ජාතික වෘත්තීය සුරක්ෂිතතාව පිළිබඳ වූ සහතිකපත්‍ර පාඨමාලාවය. වෘත්තීය සුරක්ෂිතතාව පිළිබඳව ආධුනිකයන් සඳහා මෙම පාඨමාලාව යෝග්‍යයවන්නේය. එමෙන්ම අධ්‍යාපන මට්ටම අඩු තත්ත්වයන් පැවතියද මෙම ක්ෂේත්‍රයේ අවුරුදු දෙකකට වඩා වැඩි පළපුරුද්ද ලබාගත් පුද්ගලයකුට න්‍යායාත්මක දැනුම පිළිබඳව අවබෝධයක් ලබාගැනිමට මෙම සහතිකපත්‍ර පාඨමාලාව තුළින් හැකියාව ලැබෙන අතර අප ආයතනය තුළ දින 15 ක් පුරාවට අධ්‍යාපනය ලබාදෙමින් මෙම සහතික පත්‍ර පාඨමාලාව පවත්වනු ලැබේ. සේවයේ නිරත පුද්ගලයන්ට පැමිණිය හැකි පරිදි සති අන්තයේදී පැවැත්වීමට කටයුතු කරනු ලැබේ. එමෙන්ම එහි එක් ආයතනයන්හි ඉල්ලීම මත අප විසින් සති තුනක් පුරා නොනවත්වාම මෙම සහතිකපත්‍ර පාඨමාලාව සිදු කරන අවස්ථාද ඇත.

දින 15 ක අධ්‍යයන කාලය නිම වූ පසු ඔවුන්ගේ දැනුම පරීක්ෂා කර බැලීමට විභාග යක් පවත්වනු ලබන අතර ඒ අතරින් සමත්වන පිරිසට සහතිකපත්‍ර ප්‍රධානය කිරීම සිදු කරනු ලැබේ . අධ්‍යයන පොදු සහතිකපත්‍ර උසස් පෙළ සුදුසුකම් සපුරා ඇති වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය පිළිබඳව උනන්දුවක් දක්වන ඕනෑම පුද්ගලයකුට මෙම පාඨමාලාව හැදෑරීමට අවස්ථාව අප විසින් ලබා දෙනු ලබයි.

## ■ තෙවන මට්ටම

ශ්‍රී ලංකාව තුළ සුරක්ෂිත වැඩබිම් බිහිකරවාලීම සඳහා අවශ්‍යය වන වෘත්තීය සුරක්ෂිතතා නිළධාරීන් බිහිකරනු වස් අප විසින් ක්‍රියාත්මක කරනු ලබන තෙවන මට්ටමේ පුහුණුවීම් හේතුපාදක වන්නේය. ජාතික වෘත්තිය සුරක්ෂිතතාව පිළිබඳව උසස් ඩිප්ලෝමා පාඨමාලාව හා ඩිප්ලෝමා පාඨමාලාව මේ සඳහා අයත් පුහුණුවීම් ලෙස දැක්විම් හැකිය. මේ වන විට ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය පිළිබඳව ඩිප්ලෝමා පාඨමාලාව අප විසින් පවත්වාගෙන යනු ලැබේ.

කර්මාන්තයන්හි පවතින අවශ්‍යයතා හා එම අවශ්‍යයතා තක්සේරු කිරීමේන් අනතුරුව ඩිප්ලෝමා පාඨමාලාව සකස් කර ඇත. මෙය මොඩියුල තුනකින් පවත්වන අතර එය වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය මොඩියුලය, වෘත්තීය ආරක්ෂණ මොඩියුලය සහ වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය මොඩියුලය ලෙස සකස් කර ඇත. එම මොඩියුලයන් සදහා අවශ්‍යය දැනුම මාස හතරක් පුරාවට ලබා දෙන අතර එක් මොඩියුලයක් අවසානයේදී ඒ සදහා මොඩියුල විභාගය පවත්වනු ලැබේ. ඒ අනුව මොඩියුල තුනම විභාග තුනක් පවත්වනු ලැබේ. එසේම මොඩියුල තුනම අවසානයේදී තමා ලබාගත් න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම උපයෝගි කරගිනිමින් ව්‍යාපෘති වර්තාවක් සකස් කළ යුතුව ඇත.

අවසානයේදී ව්‍යාපෘති වාර්තාවන් සකස් කළ යුතුව ඇත. අවසානයේ ව්‍යාපෘති වාර්තාවන් සමග viva සඳහා ඉදිරිපත් වී තමා ලබාගත් දැනුම පිළිබඳව විභාගයට ලක් කරනු ලැබේ.

මෙම විභාග වලදි මෙන්ම ව්‍යාපෘති වාර්තාවට හා viva සඳහා ලබාගත් ලකුණු අනුව සලකා බලා ඔවුන් වෙත ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය පිළිබඳව ඩිප්ලෝමාව පිරිනමනු ලැබේ. ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාවට අවශ්‍යය කටයුතු ප්‍රතිපාදනය කරගනිමින් එම කටයුතු සකස් කිරීම මේ දිනවලදී සිදු කරනු ලැබේ. හැකි ඉක්මණින්ම ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය පිළිබඳව උසස් ඩිප්ලෝමා පාඨමාලාව ආරම්භ කිරීම අපගේ අපේක්ෂාවයි.

## (ආ) ව්‍යාපෘති

ජාත්‍යන්තර කම්කරු සංවිධානය හා එක්ව මෙරට වැඩකරන ජනතාවගේ සුරක්ෂිතතාවය හා සෞඛ්‍යය ගොඩනංවාලීමට අදාළ වන පරිදි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අප කටයුතු කරන්නෙමු. විදේශ ආධාර ලබා දෙන ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ආධාර උපකාර වැඩකරන ජනතාව වෙත ලබා දීමට අවස්ථාව සලසාදීමට මෙවැනි ව්‍යාපෘති අප සිදු කරන්නෙමු.

## (ඇ) ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය සම්මාන උළෙල සංවිධානය කිරීම

වැඩකරන ජනතාව වෙනුවෙන් කැපවී කටයුතු කරන කර්මාන්තයන් ඇගයීමට ලක්කිරීම අප මෙතුළින් අපේක්ෂා කරන්නෙමු. නිවැරදි ලෙස තම සේවාදායකයන්ගේ සුරක්ෂිතතාවය හා සෞඛ්‍යය පිළිබඳව නිරන්තරයෙන්ම විමසුමට ලක් කරමින් ඒ සඳහා අවශ්‍යය ක්‍රියාමාර්ග ඇගයීම මෙන්ම අනෙකුත් කර්මාන්තයන්ටද ඒවායේ ආදර්ශය ලබාදීම මෙමඟින් සිදුවේ. මෙවැනි සම්මාන උළෙලකදී සම්මාන ලබාගැනීමට කර්මාන්තයන් නිතැනින්ම කැමැත්තක් දක්වන අතර ඒ තුළින් ලංකාව පුරා සුරක්ෂිත වැඩබිම් ඉදිකිරීමට හැකියාවක් උදාවේ. සෑම වසර දෙකකට වරක් මෙම සම්මාන උළෙල පැවැත්වීමට අප කටයුතු සම්පාදනය කරන්නෙමු.

## (ඈ) ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය පිළිබඳව සම්මන්ත්‍රණය සංවිධානය කිරීම

වැඩ කරන ජනතාවගේ සුරක්ෂිතභාවය පිළිබඳව සුරක්ෂිතතා නිලධාරීන් හට නව තාක්ෂණික දැනුම ලබාදීමට හා නව තාක්ෂණික උපකරණ ආදිය පිළිබඳව ඔවුන් දැනුවත් කිරීම උදෙසා ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය පිළිබඳව සම්මන්ත්‍රණ උළෙල සංවිධානය කරනු ලැබේ. මෙහිදී විදේශ සම්පත් දායකත්වයද ලබා ගනිමින් ඔවුන් සතු නව දැනුම අප රටට ලබා ගැනීමට අප කටයුතු කරන්නේමු. තවද මෙහිදී න්‍යාත්මක දැනුම මෙන්ම ප්‍රායෝගික පුහුණුවද සුරක්ෂිතතා නිලධාරීන් වෙත ලබාදීමට අප උත්සහ දරන්නෙමු.

### (ඉ) වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණයන්හි නිරතවීම

දිනෙන් දින යාවත්කාලීන වන තොරතුරු පිළිබඳව වෘත්තීය සුරක්ෂිතතා නිලධාරීන් දැනුවත් කිරීම අප ආයතනයේ ප්‍රධාන කාර්යයන් වන බැවින් ඒ සඳහා පර්යේෂණ සිදුකරමින් නව තොරතුරු ලබා ගැනීමට සිදුවේ. මේ හේතුවෙන් වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය ක්ෂේත්‍රයේ පිළිබඳව සිදුකරන පර්යේෂණයන් පිළිබඳව අප දැනුවත් වන අතරම ඒ සඳහා අපට හැකි දායකත්වය දීමටද අප නිරන්තරයෙන් කටයුතු කරන්නෙමු.

### (ඊ) වෘත්තීය සුරක්ෂිතතා නිළධාරීන් සඳහා ජාතික සංගමය පිහිටුවීම

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය පිළිබඳ වෘත්තීයන්ට හා අපගේ සිසුන්ට අවශ්‍යය කටයුතු සඳහා අවස්ථාව ලබාදීම උදෙසා ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය නිලධාරී ජාතික සංගමය පිහටුවන ලදී. කොළඹ හිල්ටන් හෝටලයේදී සාමාරම්භක උළෙල පවත්වා මෙය ආරම්භ කරනු ලදී. වෘත්තීකයන් හා සිසුන් වෙත වරප්‍රසාද ලබාදීම මෙමගින් අපේක්ෂිතය.

### (ඒ) සුබසාධන කාර්යන්හි නිරත වීම

නොයෙක් අඩුපාඩුකම් හේතුවෙන් තමන්ට අවශ්‍යය සුරක්ෂිතතා හා සෞඛ්‍යයද සම්පන්නභාවය පවත්වා ගත නොහැකි වෘත්තීකයන් උදෙසා සුබසාධන සේවාවන් සලසාදීමට අප නිරන්තරයෙන්ම කටයුතු කරන්නෙමු. එමෙන්ම පාසල් සිසුන් තුල මනා සෞඛ්‍යයක් ඇති කිරීම උදෙසා නිරන්තර දැනුවත් කිරීම් සිදු කිරීම සඳහා අවශ්‍යය වැඩසටහන් උදෙසා අප දායකත්වය ලබා දෙන්නෙමු. ශ්‍රී ලංකාවේ ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය ස්ථාපිත කරනුවස් අවශ්‍යය සෑම අවස්ථාවකදීම ස්වේච්ඡාවේන් ඉදිරිපත් වී එම ජාතික වගකීම අප කර මතට ගෙන කටයුතු කිරීමට අප ඇපකැපවී සිටින්නෙමු.

## 2.1.3 ජාත්‍යාන්තර සහයෝගීතාව

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය පිළිබඳව ජාත්‍යන්තරය හා සම්බන්දවී කටයුතු කිරීමට අප වගබලා ගන්නෙමු. ජාත්‍යාන්තර ආයතන සමඟ උරෙනුර ගැටෙමින් ඔවුන් හා එක්ව යමින් ජාත්‍යන්තරයේ සහයෝගය අප රට වෙත ලබාගැනීමට අප නිරන්තරයෙන්ම උත්සහා දරන්නෙමු. එහි ප්‍රතිඵලයක් වශයෙන් විදේශීය වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය ආයතනය සමඟ කටයුතු කිරීමට අප ආයතනයට අවස්ථාව හිමිවී තිබීම තුළින් එය පැහැදිලිවනු ඇත.

## 2.2. සේවා පහසුකම් දියුණු කිරිම

අප ආයතනයේ ප්‍රමිතිය ඉහළ මට්ටමට නංවා ගැනීම උදෙසා මෙන්ම භෞතික පහසුකම් දියුණු මට්ටමකට ගෙන ඒමට අප නිරන්තයෙන්ම උත්සහ දරන්නෙමු .එහිදී ආයතනයේ ප්‍රමිතිය පවත්වා ගැනීමට ආයතනයේ සේවා පරිසරයද වැඩ කිරීමට යෝග්‍යයම පරිදි ගොඩනංවාලීමට අවැසි කටයුතු සම්පාදනය කිරීමට අප වගබලා ගන්නෙමු.

### 2.2.1 ආයතනයේ ප්‍රමිතිය ඉහළනංවා ගැනීමට අවශ්‍ය තත්ත්ව සහතික ලබා ගැනීම

අපගේ පුහුණු වැඩසටහන් ඉතාම ඉහළ මට්ටමේ ප්‍රමිතියන් යටතේ අප විසින් සිදු කරනු ලැබේ.ඒ සඳහා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ප්‍රමිති සහතික අප වෙත ලබාගැනිමට අවශ්‍යය කටයුතු සම්පාදනය කිරීම මෙහිදි සිදු කරනු ලබයි.

### 2.2.2. ආයතනයේ භෞතික පහසුකම් දියුණු කිරීම

වෘත්තිකයන්ට ප්‍රිය මනාප පරිසරයක් තම සේවා පරිසරය තුළ ගොඩනැංවීමට උපදෙස් සපයන අප ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය ආයතනය තුළ සේවා පරිසරයද ප්‍රියමනාප පරිසරයක් ලෙස සකස් කිරීමට උත්සහ කරන්නේ අප ආයතනයේ සේවකයින්ට ප්‍රියමනාප පරිසරයක් තුළ සේවාවන් ඉටු කිරීමට අවස්ථාව ලබා දීමට මෙන්ම, වෘත්තිකයන්ට හිතකර පරිසරයක් ගොඩනංවාදීමේ අවශ්‍යයතාව ක්‍රියාවෙන්ම සනාථකර පෙන්වා දීමටය. පැරණි ගොඩනැගිල්ලක් තුළ අප ආයතනය පැවතියද හැකි සෑම විටම එයට නව මුහුණුවරක් ගෙන දෙමින් සේවා පරිසරය වෘත්තිකයන්ට ආකර්ශණීය අන්දමින් සකස් කිරීම කෙරෙහි අපගේ අවදානය නිරන්තයෙන්ම යොමු කර සිටින්නෙමු.

# තෙවන පරිච්ඡේදය

## ආයතනයේ ප්‍රගතිය

# ආයතනයේ ප්‍රගතිය

## 3.1 සේවා සැපයීමේ ප්‍රගතිය

අප ආයතනය විසින් දෛනික කාර්යයන් ලෙස සිදු කරනු ලබන පාරිසරික මිනුම් සමීක්ෂණ 182 ක් සිදු කිරීමට 2022 වර්ෂයේදී අවස්ථාව උදාවිය. පහත 3.1 වගුව ඇසුරෙන් අප සිදු කරනු ලැබූ සේවාවන් පිළිබඳව අවබෝධයක් ලබා ගත හැකිය.

| පාරිසරික සමීක්ෂණ | ආයතන ප්‍රමාණය |
|---|---|
| ආලෝකය | 2100 |
| ශබ්ධය | 1680 |
| උෂ්ණත්වය | 750 |
| දූවිල්ල | 1200 |
| වාතය | 285 |
| වාත සමීක්ෂණය | 360 |

3.1 වගුව පාරිසරික මිනුම් සමීක්ෂණය

### අවදානම් තක්සේරු කිරීම

අවදානම් තක්සේරු කිරීම අප විසින් සිදු කරනු ලබන සාමාන්‍යය ක්‍රියාකාරකමකි. අවදානම් තක්සේරු කිරීම් මත පදනම්ව, ආරක්ෂිත සහ සෞඛ්‍යය සම්පන්න සේවා පරිසරයක් නිර්මාණය කිරීම හා කර්මාන්ත තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා අප ආයතනය නිර්දේශ ලබා දෙයි. ඒ අනුව 2022 වර්ෂය තුළ අවදානම් තක්සේරු කිරීම් 38 කට වැඩි ප්‍රමාණයක් අප විසින් සිදු කරන ලදී.

### වැඩ සඳහා යෝග්‍යයතාවය තක්සේරු කිරීම

සේවයේ නිතර වෘත්තිකයන්ගේ සෞඛ්‍යය තත්ත්වය නිසායාකාරව තියනවාද යන්න තීරණය කිරීමට වෛද්‍යය පර්යේෂණ සිදු කරනු ලබයි. 2022 වර්ෂයේදී ආයතන පහක් සඳහා අප ආයතනය විසින් වෛද්‍ය පර්යේෂණ සිදු කරන ලදී.

සේවකයින් අතර අනතුරුදායක නිරාවරණයේ සෞඛ්‍යය ට බලපෑම තක්සේරු කිරීමේ අරමුණින් වැඩ කිරීමට යෝග්‍යයතාවය තක්සේරු කිරීම සිදු කරන ලදී. වැඩ කරන පාරිසරික උවදුරුවලට නිරාවරණයවීම වැළැක්වීම සහ තක්සේරු කිරීම සඳහා ඕනෑම සේවා ස්ථානයක සිටින සියලුම සේවකයින් කාලෝචිත ලෙස තක්සේරු කළ යුතුය. ඒ අනුව අප කණ්ඩායම කර්මාන්තශාලා පරිශ්‍රයට පැමිණ සේවක නිරාවරණ මට්ටම් නිරීක්ෂණය කරයි. නැතහොත් ඔවුන් අප පරිශ්‍රයට පැමිණ පරීක්ෂණ සිදුකරගනු ලබයි. ඔවුන්ගේ නිශ්චිත රැකියා කාර්යයට යෝ්‍යයතාවය සහතික කිරීම සඳහා පරීක්ෂණ වාර්තා මත පදනම්ව විශ්වාසදායක වෛද්‍යය වාර්තාවක් අප විසින් ලබාදෙනු ලැබේ.

NIOSH හි පහත පරීක්ෂණ පහසුකම් ඇත.

- ශ්‍රවන පරීක්ෂාව
- විවිධ රසායනික නිරාවරණ සඳහා රුධිර පරීක්ෂාව
- රැකියා සඳහා යෝග්‍යයතාවය සහතික කිරීම
- පෙනහළු ක්‍රියාකාරිත්වය පරීක්ෂා කිරීම
- දෘශ්‍යය පරීක්ෂා කිරීම

අනතුරුදායක නිරාවරණයන් හේතුවෙන් සේවකයින්ගේ බලපෑම තක්සේරු කිරීම සඳහා සිදු කරන ලදී.
ඒ අනුව පහත පරීක්ෂණ

| අධ්‍යයනය කළ ආයතන ගණන | සිදු කරන ලද පරීක්ෂණ වර්ගය | සිදු කරන ලද පරීක්ෂණ ගණන |
|---|---|---|
| 12 | පෙනහළු ක්‍රියාකාරිත්වය | 380 |
| | ශ්‍රවන පරීක්ෂාව | 275 |
| | සිදු කරන ලද පරීක්ෂණ වර්ගය | 165 |
| එකතුව | | 820 |

**3.1.2 විශේෂ වැඩසටහන්වල ප්‍රගතිය**

## 3.2 සේවා සැපයීමේ ප්‍රගතිය

සෞඛ්‍යය හා සුරක්ෂිත නිළධාරීන් පුහුණු කිරීම අප ආයතනය විසින් සිදු කරනු ලබන විශේෂ වැඩසටහනකි. 2022 වර්ෂයේදී සිදු කරන ලද විශේෂ වැඩසටහන්වල ප්‍රගතිය පහත වගුව තුළින් දැක ගත හැකිය.

| මට්ටම | වැඩසටහන | කාලපරිච්ඡේදය |
|---|---|---|
| පළමු මට්ටම | ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව (ඉංග්‍රිසි මාධ්‍යය) | 2022 මාර්තු 26 - කණ්ඩායම් 01 (සිසුන් ගණන 10) |
| | ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (ඉංග්‍රිසි මාධ්‍යය) | 2022 මැයි 29 - කණ්ඩායම් 23 (සිසුන් ගණන 20)<br>2022 නොවැම්බර් 05 - කණ්ඩායම් 24 (සිසුන් ගණන 42) |
| | ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (සිංහල මාධ්‍යය) | 2022 මැයි 10 - කණ්ඩායම 02 (සිසුන් ගණන 10) |

| | | |
|---|---|---|
| දෙවන මට්ටම | ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව | 2022 ජනවාරි 28 - කණ්ඩායම 43 (සිසුන් ගණන 17)<br>2022 මාර්තු 21 - කණ්ඩායම 44 (සිසුන් ගණන 27)<br>2022 ජූලි 28 - කණ්ඩායම 45 (සිසුන් ගණන 19)<br>2022 අගෝස්තු 04 - කණ්ඩායම 46 (සිසුන් ගණන 17) |
| තෙවන මට්ටම | ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය පිළිබඳ පදනම් පාඨමාලාව | 2022 මැයි 21 - කණ්ඩායම 06 (සිසුන් ගණන 11)<br>2022 ඔක්තොම්බර් 20 - කණ්ඩායම 07 (සිසුන් ගණන 15) |
| | විධායක ශ්‍රේණි නිළධාරීන් සඳහා වන විශේෂ පාඨමාලාව | 2022 ජනවාරි 08 - කණ්ඩායම 05 (සිසුන් ගණන 15)<br>2022 අගෝස්තු 10 - කණ්ඩායම 06 (සිසුන් ගණන 12)<br>2022 දෙසැම්බර් 19 - කණ්ඩායම 07 (සිසුන් ගණන 19) |
| | කාර්මික සංවර්ධන මණ්ඩලය හා එක්ව කලාපයේ සේවකයන් සඳහාවූ සහතිකපත්‍ර පාඨමාලාව | 2022 ඔක්තොම්බර් 10 (සිසුන් ගණන 59) |
| | සුරාබදු ආයතනය හා සම්බන්ධවී කරනු ලබන සාත්තු සේවකයින් සඳහා වූ සහතිකපත්‍ර පාඨමාලාව | 2022 සැප්තැම්බර් 10 (සිසුන් ගණන 58)<br>2022 ඔක්තොම්බර් 08 (සිසුන් ගණන 49)<br>2022 නොවැම්බර් 11 (සිසුන් ගණන 139) |

**3.2 වගුව විශේෂ වැඩසටහන් වල ප්‍රගතිය**

ඩිප්ලෝමා පාඨමාලාවෙන් පසුව කර්මාන්තමය අංශය තුල සේවයේ නියුතුවූවන්ගේ දැනුම වැඩිදියුණු කිරීම සඳහා සහ අදාල ක්ෂේත්‍රය තුල විශේෂඥ දැනුම ලබා දීම සඳහා මෙම උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව හඳුන්වාදෙන ලදී. 2022 මාර්තු මස මෙම පාඨමාලා පළමුවරට ආරම්භ කරන ලදී. පළමු කණ්ඩායම සිසුන් 10 දෙනෙක්ගෙන් සමන්විතය.

2022 වර්ෂය තුළදී ඩිප්ලෝමා පාඨමාලා තුනක් පවත්වන ලදී. අපගේ ඩිප්ලෝමා පාඨමාලාව ඉංග්‍රිසි මාධ්‍යයෙන් හා සිංහල මාධ්‍යයෙන් සමන්විතවේ. 2022 වර්ෂයේදී ඉංග්‍රීසි මාධයයෙන් පාඨමාලා දෙකක් හා සිංහල මාධ්‍යයෙන් එක් පාඨමාලාවක් පවත්වන ලදී. ඉංග්‍රිසි මාධ්‍යයෙන් පවත්වන ලද කණ්ඩායම් දෙකට සිසුන් 62 ක් සහභාගී වූ අතර සිංහල මාධ්‍යය පාඨමාලාව සිසුන් 10 දෙනෙක්ගෙන් සමන්විත විය. ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය පිළිබඳව සහතිකපත්‍ර පාඨමාලා හතරක් 2022 වර්ෂයේදී පවත්වන්නට කටයුතු කරන ලදී. කණ්ඩායම් 43, 44, 45 හා 46 ,2022 වර්ෂයේදී අවසන් කරන ලදී. මෙම පාඨමාලාවන් හතර සඳහා සිසුන් 80 ක් සහභාගීවිය.

අප ආයතනය විසින් සිදු කරනු ලබන ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය පිළිබඳව පදනම් පාඨමාලා දෙකක් 2022 වර්ෂයේදී පවත්වන ලදී. 6 වන කණ්ඩායම හා 7 වන කණ්ඩායම් වල පදනම් පාඨමාලාව නිම කරන ලද සිසුන් පුහුණුවීම් සඳහා යොමුකර ඇත. 2022 වර්ෂයේදී විධායක ශ්‍රේණි නිළධාරීන් සඳහා වන විශේෂ පාඨමාලා තුනක් පවත්වන්නට කටයුතු කරන ලදී.

කාර්මික සංවර්ධන මණ්ඩලය හා එක්ව කලාපයේ සේවකයන් වෘත්තීය සුරක්ෂිතතාවය හා සෞඛ්‍යය පිළිබඳව සහතිකපත්‍ර පාඨමාලාවක් පවත්වන්නට කටයුතු කරන ලදී. කලාපයේ සේවකයන් 59 දෙනෙකුගේ සහභාගීත්වයෙන් මෙම පාඨමාලාව පැවැත්විණි. සුරාබදු ආයතනය හා එක්ව සිදුකරනු ලබන සාත්තු සේවකයන් සඳහා වන පාඨමාලාවේ කණ්ඩායම් තුනක් 2022 වර්ෂයේදී අවසන් කරන ලදී.

සාමාන්‍යයෙන් පවත්වනු ලබන පාඨමාලාවන්ට අමතරව කොළඹ මහ නගර සභාවේ සුළු සේවකයන් 600 ක පිරිසක් සඳහා දින 6ක සහතිකපත්‍ර පාඨමාලාවක්ද, තාක්ෂණික නිළධාරීන් 10 දෙනෙක් සඳහා දින 15ක සහතිකපත්‍ර පාඨමාලාවක්ද, ඉංජිනේරු නිළධාරීන් 30 දෙනෙකු සඳහා එක්දින සහතිකපත්‍ර පාඨමාලාවක්ද පවත්වන ලදී.

ජාතික වෘත්තීය සුරක්ෂිතතා සම්මන්ත්‍රණ උළෙල 2022 සාර්ථකව නිමකිරීමටම අපට අවස්ථාව ලැබිණි. 2022.11.17 දින කම්කරු අමාත්‍යයතුමාගේ හා ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් ජාතික වෘත්තීය සුරක්ෂිතතා සම්මන්ත්‍රණ උළෙල 2022 පවත්වනු ලැබූ අතර එදින රාත්‍රියේදී ජාතික වෘත්තීය සුරක්ෂිතතා ඩිප්ලෝමා හා සහතිකපත්‍ර ප්‍රදානෝත්සවය පවත්වන ලදී.

## ජාතික වෘත්තීය සුරක්ෂිතතා සතිය

කැබිනට් මණ්ඩලය මඟින් සෑම වර්ෂයකම ඔක්තොම්බර් මස 2 වන සතිය රැකියාවල නියුක්ත වෘත්තිකයන්ගේ සෞඛ්‍යය හා සුරක්ෂිතතාවය තහවුරු කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය සතිය ප්‍රකාශයට පත්කොට ඇත.

## අරමුණු

මෙවර ජාතික වෘත්තීය සුරක්ෂිතතා සතිය 202 නොවැම්බර් මස 22 වන දින සිට නොවැම්බර් 26 වන දින දක්වා පැවැත්වූ අතර ඒ සම්බන්ධයෙන් පහත ක්‍රියාකාරකම් සිදු කිරීමට අප කටයුතු කරන ලදී.

1 . වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය පිළිබඳ ජාතික සම්මන්ත්‍රණය -
2022 නොවැම්බර් 17

2 . වෘත්තීය සුරක්ෂිතතා නිළධාරින් සඳහා වන ඩිප්ලෝමා ප්‍රධානෝත්සවය -
2022 නොවැම්බර් 17

3 . වෘත්තීය සුරක්ෂිතතා නිළධාරින් සඳහා වන සහතිකපත්‍ර ප්‍රධානෝත්වය-
2022 නොවැම්බර් 17

4 . වෘත්තීය සුරක්ෂිතතාව පිළිබඳ සම්මේලනය -
2022 නොවැම්බර් 24 වන දින සිට 26 වන දින තෙදින පුරාවට වැඩසටහන් පවත්වන ලදී.

## වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය පිළිබඳ ජාතික සම්මන්ත්‍රණය

මෙම සම්මන්ත්‍රණය 2022 නොවැම්බර් 17 වන දින පෙ.ව 9.00 සිට පවත්වන ලදී. විදේශීය හා දේශීය දේශකවරුන්ගේ සහභාගීත්වයෙන් මෙම සම්මන්ත්‍රණය පවත්වන ලදී. වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍යය කළමණාකරන පද්ධතිය තුළින් ආරක්ෂාව දිනාගන්න යන තේමාව කරගනිමින් මෙවර ජාතික වෘත්තීය සුරක්ෂිතතා සම්මන්ත්‍රණය 2022 පවත්වන ලදී. සේව්‍යය හා සේවක දෙපාර්ශවය නියෝජනය කරමින් 350 ට වැඩි පිරිසක් මේ සඳහා සහභාගී විය. මෙය වෘත්තීය සුරක්ෂිතතාවය පිළිබඳව විදේශීය දේශකයන්ගේ සහභාගීත්වයෙන් සිදුවූ අතර ඔවුන්ගේ දැනුම හා අත්දැකීම් ලාංකික කර්මාන්තශාලාවන්හි සේවයේ නියුතුවූවන් හා බෙදා ගැනීමට අවස්ථාව උදාවිය.

# National OSH Conference 2022



















# වෘත්තීය සුරක්ෂිතතා නිළධාරීන් සඳහා වන ඩිප්ලෝමා හා සහතිකපත්‍ර ප්‍රධානෝත්සවය

වෘත්තීය සුරක්ෂිතතා නිළධාරීන් සඳහා වන ඩිප්ලෝමා හා සහතිකපත්‍ර ප්‍රධානෝත්සවය අමාත්‍යාංශ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් 2022 නොවැම්බර් 17 වන දින වන දින ප:ව 6.00 සිට පවත්වන ලදී. එහිදී ඩිප්ලෝමා පාඨමාලාව නිමවූ 104 දෙනෙක් වෙත සහතිකපත් ප්‍රදානය කරන ලදී.



# සිව්වන පරිච්ඡේදය

## 2022 වර්ෂයේදී ලබා ගත් සුවිශේෂී ජයග්‍රාහණ හා ආයතනය මුහුණ දුන් ගැටලු

# 2022 වර්ෂයේදී ලබා ගත් සුවිශේෂී ජයග්‍රාහණ හා ආයතනය මුහුණ දුන් ගැටලු

2022 වසර රට දැඩි ආර්ථික අර්බුදයකට මුහුණ පා සිටින බව ශ්‍රී ලංකා රජය ප්‍රකාශ කළේය. ඒ අනුව තීරනාත්මක ඉන්ධන හිඟයක් ඇති වූ අතර, 2022 වසර තුළ කර්මාන්ත ද බරපතල මූල්‍ය අර්බුදයකට මුහුණ දුන්නේය. අප බොහෝ දුරට පෞද්ගලික අංශයේ කර්මාන්ත සඳහා සේවය කරයි.

ඒ අනුව, අපගේ සේවාවන් ලබා ගත් සමහර ඉදිකිරීම් කර්මාන්ත සහ නිෂ්පාදන කර්මාන්ත සම්පූර්ණයෙන්ම වසා දැමීමට සිදු වූ බැවින් වෘත්තීය සුරක්ෂිතතා පුහුණු සඳහා සහභාගීත්වය අඩුවීමේ ප්‍රවණතාවක් අපට පෙන්නුම් කළේය. මෙම තත්ත්වය පාරිසරික අධීක්ෂණයට සහ වැඩ ඇගයුම් සඳහා යෝග්‍යයතාවයට මෙන්ම අවදානම් තක්සේරුවලට ද බලපෑවේය.ඒ අනුව අප ආයතනයටද එය සෘජුවම බලපෑම් එල්ල කරන ලදී.

නමුත් අපගේ සැලැස්ම ක්‍රියාවට නංවා අපගේ තැන්පතු වැඩි පොලී අනුපාතයකට නැවත ආයෝජනය කළෙමු. දෙවනුව පරිත්‍යාගශීලී ආයතන සඳහා යෝජනා සකස් කළ අතර අනෙකුත් කාර්මික අංශ සඳහා වෘත්තීය සුරක්ෂිතතා ව්‍යාපෘති සකස්කර ඒවා අප ආයතනය වෙත ලබා ගැනීමට හැකි විය. අපගේ සේවාවන් රට පුරා වෙසෙන වෘත්තිකයන් වෙත සලසාදීමට මෙමඟින් හැකි විය. අපවෙත ළඟා වීමට නොහැකි වූ පුද්ගලයින් මාර්ගගතව සම්බන්ධකරගනිමින් පුහුණුව සඳහා සහභාගී කරගැනීමට අප කටයුතු කරන ලදී. මෙමගින් සහභාගිවන්නන්ගේ ප්‍රවාහන වියදම අඩු වන අතර රටතුළ පැවති තීරනාත්මක ඉන්ධන අර්බුදය ජය ගැනීමට අපට හැකි විය. වැදගත් කරුණක් නම් නිවසේ සිටම වැඩ කළ හැකි බැවින් ඉන්ධන ප්‍රශ්නය සහ ප්‍රවාහන ගැටලු මඟහරවා ගැනීමට කාර්ය මණ්ඩලයට ද අවස්ථාව ලැබුණි. අප විසින් සේවකයන්ට නිවසේ සිට සුවපහසු ලෙස වැඩ කිරීමට අවශ්‍යය සැපයුම් සහ පහසුකම් සපයන ලදී.

2022 වසරේදී ඉතිහාසයේ ප්‍රථම වරට වෘත්තීය සුරක්ෂිතතා පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාවක් අප විසින් මෙරට ආරම්භ කරනු ලැබූ අතර ඒ සඳහා NVQ 6 සහතිකය ලබා ගැනීමට අවශ්‍යය කටයුතු සම්පාදනය කරමින් පවතී. 2022 වසර අවසානයේ අපට රුපියල් මිලියන 48 ක ලාභයක් උපායාගැනීමට අප සමත්විය. ශ්‍රී ලංකාවේ පැවති ආර්ථික අවපාතය තුළ එය විශාල ජයග්‍රහනයක් සේ සැලකිය හැකිය.

# පස්වන පරිච්ඡේදය

## ආයතනයේ මූල්‍යය ප්‍රගතිය

# ආයතනයේ මූල්‍යය ප්‍රගතිය

## මූල්‍යය තත්ත්වය ප්‍රකාශය

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය ආයතනය
2022 දෙසැම්බර් 31 වන දිනට
ශේෂ පත්‍රය

| | | 2022 | 2021 |
|---|---|---|---|
| වත්කම් | | | |
| ජංගම වත්කම් | | | |
| මුදල් හා මුදල් සමාන දෑ | | 6,421,557 | 2,341,266 |
| ලැබිම් | Note 1 | 31,265,546 | 9,278,889 |
| සංවර්ධන අරමුදල | Note 2 | 202,543,847 | 171,759,456 |
| | | 240,230,950 | 183,379,611 |
| ස්ථාවර වත්කම් | | | |
| භාණ්ඩාගාර තැම්පතු | | | |
| දේපල පිරියත හා උපකරණ | Note 3 | 58,913,977 | 55,329,469 |
| මුළු සංචිත | | 299,144,927 | 238,709,080 |
| වගකීම් | | | |
| ජංගම වගකීම් | | | |
| ගෙවිම් | Note 5 | 4,384,599 | 3,552,398 |
| මුළු වගකීම් | | | |
| ශුද්ධ වත්කම් | | 294,760,327 | 235,156,682 |
| අතිරික්ත ආදායම | Note 4 | 294,760,327 | 235,156,682 |
| මුළු ශුද්ධ වත්කම් | | 294,760,327 | 235,156,682 |

## ආදායම් ප්‍රකාශය

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය ආයතනය
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
ආදායම් ප්‍රකාශය

| ආදායම | 2022 | 2021 |
|---|---|---|
| භාණ්ඩාගාර ලැබීම් | 6,268,890 | 6,471,700 |
| මෙහෙයුම් ආදායම | 49,323,571 | 40,651,724 |
| පොළී ආදායම | 29,242,289 | 9,315,013 |
| වෘත්තීය සුරක්ෂිතතා සම්මන්ත්‍රණය | 4,945,500 | 2,852,000 |
| | 89,780,250 | 59,293,417 |
| වියදම් | | |
| ආයතන පරිපාලන වියදම් | 29,948,337 | 26,288,262 |
| මුල්‍යත වියදම් | 4,646,774 | 1,784,377 |
| ක්ෂය | 7,068,521 | 6,098,545 |
| මුළු වියදම් | 41,663,632 | 34,171,184 |
| වර්ෂයේ අතිරික්තය | 48,116,618 | 25,122,253 |

170

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } LSW/B/NIOSH/SR/1/2022 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2023 මැයි 31 දින

13 JUN 2023 NIOSH

සභාපති,

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ආයතනය.

**ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) සම්පූර්ණයෙන්ම ක්ෂය වූ පිරිවැය රු.3,096,741 ක පිරියත හා උපකරණ රු.965,000 කට ප්‍රත්‍යාගණනය කොට තිබූ අතර මෙම ප්‍රත්‍යාගණන වත්කම්වලට අදාලව සියයට 20 බැගින් වර්ෂයට අදාල රු.193,000 වූ ක්ෂය, ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) වටිනාකම රු.500,000 කට ප්‍රත්‍යාගණනය කොට තිබූ පරිගණක උපකරණ සඳහා ක්ෂය ගණනයේදී පරිගණක උපකරණවල ප්‍රත්‍යාගණිත වටිනාකම රු.50,000 ක් ලෙස සලකා වර්ෂයට සියයට 20 බැගින් රු.10,000 ක් ලෙස ක්ෂය කර තිබීම නිසා සමාලෝචිත වර්ෂයේ අතිරික්තය හා දේපල පිරියත හා උපකරණවල වටිනාකම රු.90,000 ක් වැඩියෙන් දැක්වුණි.

(ඇ) වටිනාකම රු.600,000 ක්වූ වෛද්‍ය උපකරණ ප්‍රත්‍යාගණනය කොට තිබූ අතර වර්ෂයට අදාල ක්ෂය ගණනයේදී ප්‍රත්‍යාගණිත වටිනාකම රු.500,000 ක් ලෙස ගෙන ක්ෂය කොට තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය හා දේපල පිරියත හා උපකරණවල වටිනාකම රු.10,000 ක් වැඩියෙන් දැක්වුණි.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

(ඇ) පිරිවැය රු.13,553,678 ක් වූ වත්කම් රු.9,077,000 කට ප්‍රත්‍යාගණනය කිරීමෙන් විගණනයට අනුව ප්‍රත්‍යාගණන ලාභය රු.9,039,528 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශයේ ප්‍රත්‍යාගණන ලාභය ලෙස රු.9,476,327 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව ප්‍රත්‍යාගණන ලාභය රු.436,800 ක් වැඩියෙන් දැක්වුණි.

(ඉ) වත්කම් ප්‍රත්‍යාගණන උපලේඛණයට අනුව සම්පූර්ණයෙන්ම ක්ෂය වූ පිරිවැය රු.14,058,605 ක වත්කම් 2022 දෙසැම්බර් 31 දිනට රු.9,077,000 කට ප්‍රත්‍යාගණනය කළ බව දක්වා තිබුණත් මූල්‍ය ප්‍රකාශනවලට අනුව එම වත්කම්වල පිරිවැය රු.13,553,679 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව උපලේඛණය හා මූල්‍ය ප්‍රකාශන අතර රු.504,926 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඊ) කෙටුම්පත් විගණන වාර්තාව සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරිය විසින් ඉදිරිපත් කරන ලද පිළිතුරු සමඟ ඉදිරිපත් කර ඇති මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පරීක්ෂා කිරීමේදී පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) ප්‍රවර්තන වර්ෂයේ පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන හැර වෙළඳ හා අනෙකුත් ගෙවීම්වල ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.196,675ක වැඩිවීමක් පවතින නමුත් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කිරීමේදී රු.454,328 ක අඩුවීමක් ලෙස දක්වා තිබුණි.

(ii) මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී ගැලපුම් ලෙස දේපල පිරියත උපකරණ ප්‍රත්‍යාගණන අතිරික්තය රු.436,801 ක් ලෙස සටහන් විය යුතු වුවත් එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු.399,994 ලෙස දක්වා තිබුණි.

(iii)වාර්ෂික ස්ථාවර තැන්පතු පොලී ලැබීම රු.6,418,005 ක් වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල එය රු.4,406,623 ලෙස දක්වා තිබුණි.

(iv)වාර්ෂික ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම් රු.3,569,880 වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ එය රු.6,268,890 ලෙස දක්වා තිබුණි.

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 1 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන උපචිත ගිණුම්කරණ පදනම අනුව පිළියෙල කළ යුතු වුවද ආයතනයේ 2022 වර්ෂය සඳහා විගණන ගාස්තු උපචිත පදනමට සටහන් කර නොතිබුණි.

(ඌ) 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පිරික්සුමෙහි ස්කන්ධය සහ රඳවාගත් ඉපයීම් වල ආරම්භක ශේෂයේ එකතුව රු. 233,597,501 ලෙස සඳහන් වුවද, අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශනයෙහි එය රු.235,156,680 ක් ලෙස දක්වා තිබූයෙන් රු.1,559,179 ක වෙනසක් නිරීක්ෂණය විය.

(එ) ආයතනයේ සේවක වැටුපෙන් අයකර ගොඩනගන ලද සේවක සුබසාධක සංගමයේ සාමාජික මුදල් රු.65,000 ක් ගෙවිය යුතු වියදම් ලෙස දක්වා තිබුණි.

**1.3 ආයතනයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුලත් අනෙකුත් තොරතුරු**

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන ආයතනයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ . මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

2

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට ආයතනයේ කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

ආයතනයේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කල යුතුය. තවදුරටත් නිවැරදි නොකල වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුලත් කරනු ඇත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

3

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධව යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| **නීතිරීති / විධානයට යොමුව** | | **නිරීක්ෂණ** |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය. | | |
| i. | 10.2 ඡේදය සහ මාර්ගෝපදේශ අංක 14 | මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනයට ඉදිරිපත් කරන ලද 2022 වර්ෂයේ කාර්යසාධන වාර්තාව අදාල චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව පිළියෙල කර නොතිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර ආයතනයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

| **නීතිරීති / විධානයට යොමුව** | | **නිරීක්ෂණ** |
|---|---|---|
| 2009 අංක 38 දරන ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතන පනත | | |
| (i) | 9 (8) උප වගන්තිය | පනතේ විධිවිධානවලට යටත්ව ආයතනයේ පාලක සභාව එහි රැස්වීම්වලදී අනුගමනය කලයුතු ක්‍රියාපටිපාටිය නිශ්චය කරමින් රීති සාදනු ලැබිය හැකි වුවද ඊට අදාල රීති සාදා නොතිබුණි. |

5

| | | |
|---|---|---|
| (ii) | 20 (1) උපවගන්තිය | අමාත්‍යවරයා විසින් පනතේ විධිවිධාන යටතේ ආයතනයේ කර්තව්‍ය කිසිවක් හෝ ඒ සියල්ල කරගෙනයාමේ කාර්යය සඳහා සහ පනතේ මූලධර්මවලට බලාත්මකභාවයක් ලබාදීමේ කාර්යය සඳහා නියෝග සාදනු ලැබිය හැකි වුවත් එම නියෝග සාදා නොතිබුණි. |
| (iii) | 11 වන වගන්තිය | ආයතනයේ කාර්යක්ෂම පරිපාලනය සඳහා අවශ්‍ය වියයුතු පරිදි ආයතනයේ අධ්‍යක්ෂවරු වශයෙන් යම් තැනැත්තන් සංඛ්‍යාවක් සභාව විසින් පත්කරනු ලැබිය යුතු වුවත් එසේ පත්කර නොතිබුණි. |

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

2021 දෙසැම්බර් 31 දින වන විට සම්පූර්ණයෙන් ක්ෂය වූ තවමත් භාවිතයේ පවතින පිරිවැය රු.24,730,308 ක් වූ වත්කම්වලින් පිරිවැය රු.11,176,630 ක් වූ වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

## 2.3. වෙනත් කරුණු

ආයතනයෙහි අනුමත කාර්යය මණ්ඩලය 25 ක් වූ අතර තත්‍ය කාර්යය මණ්ඩලය 16 ක් විය. ආයතනයේ කාර්යය හා කර්තව්‍ය මෙහෙයවීමේදී අණපණත් මගින් පැවරෙන කාර්යයන් සඳහන් ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවරාදෙන කළමණාකරණ කාර්යයන් ඉටුකිරීමේ කාර්යයෙහි නිරතවන ප්‍රධාන විධායක නිලධාරී තනතුර වන අධ්‍යක්ෂ ජනරාල් තනතුර කොන්ත්‍රාත් පදනම මත සේවය ලබාගන්නා බව නිරීක්ෂණය විය. ආයතනයේ පැවැත්ම උදෙසා වැදගත් කාර්යයභාරයක් පැවරෙන අධ්‍යක්ෂ (සෞඛ්‍ය හා ස්වස්ථතා) තනතුර සඳහාද ස්ථිර නිලධාරියෙකුගේ සේවය අවශ්‍ය වුවද, අවශ්‍ය අවස්ථාවන්හිදී සම්පත්දායකයෙකුගේ සේවය ලබාගනිමින් පැවතුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

6

# සටහන්

Ministry of
Labour and
Foreign Employment

NIOSH
National Institute of Occupational Safety and Health • Sri Lanka

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය ආයතනය
නො 97 ජාවත්ත පාර කොළඹ 05

+ 94 112 585 425

+ 94 112 585 425

info@niosh.gov.lk